# භූරිපඤ්ඤ (ප්‍රශ්නය) ජාතකය

මේද උම්මග්ග ජාතකයෙහි භූරි ප්‍රශ්නය බලා දත යුත්තේය.

ජාතක කථාව :- ඉක්බිති රජ්ජුරුවෝ මරණ භයින් තැතිගෙන අමාත්‍යයන් සතරදෙනෙකු කැඳවා සතර වාසලින් නික්ම ගොස් මහෞෂධ පණ්ඩිතයන් දුටුතැන සත්කාර කොට රථයට නංවා ගෙන එවයි විධානය කොට යවූහ. දකුණු වාසලින් නික්මුණු අමාත්‍යයා වනාහි පණ්ඩිතයන් වහන්සේ කුඹල් කමින් වසන ගමට ගොස් ඔහු දැක සත්කාර කොට ගෙන ගිය පිළිද මසුරන් දහසද අත තැබූයේය. කුඹලාණෝත් මා මෙතෙක් වැඩ ගත්තේ මහෞෂධ පණ්ඩිතයන් අතිනැයි දැන බියට පත්වූහ. පණ්ඩිතයන් වහන්සේ නොබව ආචාර්යයෙනි! තොප අපට බොහෝ උපකාර කෙළෙහියයි අසා මසුරන් දහසද ඔහුට දී මැටි වැකුණ ඇගින්ම රථයේ නැග රජ්ජුරුවන් සමීපයට ගොස් දේවයන් වහන්ස අසවල් ගම කුඹල්කම් කොට ජීවත් වෙමි. ඔබ වහන්සේ කැඳවීමෙන් මැටි වැකුණ ඇගින්ම ආමියි කීහ. රජ්ජුරුවෝ ඉදින් මොහු මට විරුද්ධ නම් සේනාව රැස්කරමින් ඇවිදිති. මූ මට සතුරු නොවෙතියි සිතා වහා ගොස් නහාපියා සර්වාලංකාරයෙන් සැරසී එවයි නියම කළහ. පණ්ඩිතයන් වහන්සේ උසස් අන්දමින් ඇඳ පැළඳ සිව්රඟ සෙනග සමග සක්දෙව් රජුමෙන් පැමිණ එකත් පස්ව සිටිසේක. එවිට රජ්ජුරුවන් වහන්සේ පණ්ඩිතයන් අමතා පුත පණ්ඩිතයෙනි! තෙපි බොහෝ අර්ථ චින්තනයෙහි දක්ෂයහ. සිතුවොත් දසදහසක් යොදුන් දඹදිව රජ්ජුරුවන් මරා රාජ්‍ය ගැනීමට පොහොසත්ය. එසේ සිටියදීත් මාමරා පියා රාජ්‍ය නොගන්නේ මන්දැයි විචාළහ.

එවිට පණ්ඩිතයන් වහන්සේ රජතුමනි නුවණැත්තෝ සුව පිණිස පව්කම් නොකරන්නාහ. කුමණ හේතුවක් නිසාවත් අනුන්ට හිංසා පීඩා නොකරන්නාහයි වදාරා තමාටත් පියාටත් මහත් සම්පත් දුන් රජ්ජුරුවන් කෙරෙහි ද්‍රෝහී නොවන බැව් දන්වා පරීක්ෂාකාරීව දශරාජ ධර්මයෙන් රාජ්‍ය කරන ලෙස අවවාද කළසේක.